# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව.

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)- 11 - 2449823

වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.l


මගේ අංකය / எனது இல. / My No.: බිඩී/සීබීපී/1/1/2010

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2010.07.15

ජාතික අයවැය චක්‍රලේඛ අංක 149

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් / පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත.

## 2010 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2010 ජූලි 09 වන දින පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබූ 2010 අංක 7 දරණ විසර්ජන පනතට අනුව, 2010 අයවැය ඇස්තමේන්තුවල ඇතුලත් ප්‍රතිපාදන වියදම් කිරීම සඳහා අදාල අධිකාරී බලපත්‍ර ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත.ඒ අනුව ගෙවීම් වවුචර්පත් හා වෙනත් ලියවිලිමත ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් විසින් පහත සඳහන් පරිදි අධිකාරිය සටහන් කළ යුතුය.

- (අ) සාමාන්‍ය පොදු සේවා සඳහා 2010 අංක 1 දරණ සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය
- (ආ) විශේෂ නීති සේවා කටයුතු සඳහා 2010 අංක 1 දරණ විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍රය
- (ඇ) අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා 2010 අංක 1 දරණ අත්තිකාරම් වොරන්ට් බලපත්‍රය

02. 2010 අංක 7 දරණ විසර්ජන පනතේ විධිවිධාන අනුව 2010 වර්ෂයේ මුල් මාස 4 සඳහා වියදම් දැරීමට බලය ලබාදුන් 2010 අතුරු සම්මත ගිණුම යටතේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (3) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් 2010.05.01 දින සිට 2010 වර්ෂය සඳහා විසර්ජන පනත සම්මත වූ දිනය දක්වා වියදම් දැරීමට ලබාදුන් අධිකාරිය මගින් සලසා දුන් ප්‍රතිපාදන ද 2010 අංක 7 දරන විසර්ජන පනත යටතේ සලසා දුන් ප්‍රතිපාදන ලෙස සැලකිය යුතුය.

03. 2010 වර්ෂයේ ඉදිරි කාලයේ (ජූලි සිට දෙසැම්බර් දක්වා) වියදම් සඳහා මාසික අක්මුදල් අවශ්‍යතාවය පිළිබඳ වාර්තා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2010.07.12 දිනැතිව නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 3/2010 මගින් දක්වා ඇති පරිදි 2010.07.23 දින හෝ ඊට පෙර එම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

04. පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද විසර්ජන පනතේ තෙවන උප ලේඛණයේ ඇතුලත් කර ඇති අත්තිකාරම් ගිණුම් පිළිබඳ සීමා තරයේ පිළිපැදිය යුතුය.

05. 2010 අංක 7 දරණ විසර්ජන පනතේ 6 වගන්තියේ විධිවිධාන අනුව, 2010 මුද්‍රිත ඇස්තමේන්තුවල අයවැය සහාය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ නිශ්චිතව සඳහන් කල කාර්යයන් සඳහා හැර අනෙකුත් කාර්යයන් සඳහා අතිරේක ප්‍රතිපාදන සලසාදීමට භාණ්ඩාගාරයට හැකියාවක් නොමැති බැවින් එක් එක් වැය ශීර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන සීමා තුල වියදම් කළමනාකරණය කර ගත යුතුය.

06. 2011-2013 මැදිකාලීන අයවැය සඳහා ශක්තිමත් පදනමක් සකස් කර ගැනීමේ පරමාර්ථයෙන් 2010 අයවැය සකස් කර ඇති බැවින් ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය වෙත සලසා දී ඇති ප්‍රතිපාදන සීමාවන් තුල තුන් අවුරුදු වියදම් වැඩසටහනකට අදාල ව්‍යාපෘති හා සංවර්ධන වැඩකටයුතු කළමනාකරණය කර ගැනීම සඳහා උපරිම කාර්යක්ෂමතාවයකින් හා ඵලදායීතාවයකින් යුතුව මූල්‍ය සම්පත් කළමනාකරණය කර ගනිමින් රජයේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට 2010 ඉදිරි කාලයේදී ඔබගේ උපරිම දායකත්වය සහ කැපවීම ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති